**ජාතික විද්‍යා පදනම - 2018**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික විද්‍යා පදනමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික විද්‍යා පදනමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 69 වගන්තිය ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම්වල ක්ෂය ගණනය කළ යුත්තේ එය භාවිතයට ගනු ලබන අවස්ථාවේ සිට වුවත් 2018 අගෝස්තු 23 දින මිලට ගත් රු.5,786,158 ක් වටිනා මයික්‍රොසොෆ්ට් ඔෆිස් සහ ප්‍රොජෙක්ට් (Microsoft Office and Project) 365 මෘදුකාංගය මිලදීගත් දින සිටම ක්ෂය කර තිබුණි. මෙම මෘදුකාංගය භාවිතයට ගෙන තිබුණේ 2019 මාර්තු 28 දින සිට ය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ක්ෂය ප්‍රතිපාදනය රු.415,335 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2019 වාර්ෂික ගිණුම් මඟින් නිවැරදි කිරීමට පියවර ගනිමි. | වත්කමක් භාවිතයට ගනු ලබන අවස්ථාවේ සිට ක්ෂය කිරීම සිදුකළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පර්යේෂණ ව්‍යාපෘති සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5 ඡේදය | පර්යේෂණ හා මූල්‍ය ප්‍රගතිය සෑම වසරකම ජූනි 15හා දෙසැම්බර් 15 දිනට ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ සිදුකළ නියැදි විගණන පරීක්ෂාවට අනුව එකතුව රු. 13,988,789 ක් වූ ව්‍යාපෘති 07ක් සම්බන්ධයෙන් නියමිත කාලය තුළ වියදම් වාර්තා ලබාගෙන නොතිබුණි. | ඇතැම් ප්‍රදානවල අතුරු මූල්‍ය වාර්තා ලබාදීමේදී ප්‍රමාදවීමක් සිදුවේ. ප්‍රදාන කොන්ත්‍රාත්තුවක් ගිවිසුමේ සඳහන් විධාන වලට අනුව කටයුතු කරන ලෙස ප්‍රදානලාභීන්ට තදින් අවවාද කර ඇත. | පර්යේෂණ ව්‍යාපෘති සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 05 ඡේදය අනුව පර්යේෂණ හා මූල්‍ය ප්‍රගතිය ජූනි 15 හා දෙසැම්බර් 15 දිනට ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | අංක:PED1/2015 හා 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.5 වගන්තිය | නිල වාහනයක් හෝ ප්‍රවාහන දීමනාවක් හිමි නිලධාරියෙකු ආයතනයේ වෙනත් වාහනයක් භාවිතා නොකළ යුතු වුවත් ප්‍රවාහන දීමනා ලබා ගන්නා නිලධාරියෙක් අවස්ථා 05 කදී ආයතනයේ වාහනයක් භාවිතා කර තිබීම විගණනයේදී නිරීක්ෂණය විය. | එකම වෙලාවක එකම ස්ථානයක පැවති කාර්යයක් සඳහා ආයතනයේ වෙනත් නිලධාරීන් සමඟ සහභාගීවීම හේතුවෙන් ආයතනයේ වාහනය භාවිතා කර තිබුණි. | නිල වාහනයක් හෝ ප්‍රවාහන දීමනාවක් හිමි නිලධාරීන් සඳහා ආයතනයේ වාහන පහසුකම් ලබා දීම නොකළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 31,393,000 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 17,990,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 13,403,000 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වැටුප් හා වේතන රු. 13,600,000 කින් වැඩිවී තිබීම හා ප්‍රවාහන හා ඉන්ධන දීමනා රු. 6,474,000 කින් වැඩිවී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.1** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පර්යේෂණ ප්‍රදාන යටතේ සමාලෝචිත වර්ෂයේ නිම කරන ලද රු.46,768,435 ක් වූ ව්‍යාපෘති 18 අතුරින් රු. 41,980,228 ක් වූ ව්‍යාපෘති 16 ක් 2019 මාර්තු 31 විගණන දිනය වන විටත් ආර්ථික හා සමාජීය සංවර්ධන කාර්යයන් සඳහා යොදාගෙන නොතිබුණි. | ජාතික විද්‍යා පදනම මූලික හා ව්‍යවහාරික පර්යේෂණ සඳහා සහය වීමට 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ පනත යටතේ පිහිටුවා ඇත. මෙම පර්යේෂණ මඟින් සමාජ හා ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමට දිගු කාලයක් ගත වේ. කෙසේ වෙතත් ජාතික විද්‍යා පදනම පර්යේෂණ මඟින් සමාජ හා ආර්ථික ප්‍රතිලාභ වාර්තාකරණයෙන් ලබා දීමට කටයුතු කර ඇත.<br>ඒ අතර විද්‍යා හා තාක්ෂණය දියුණු කිරීම, ධාරිතා වර්ධනය, යටිතල පහසුකම් සංවර්ධන, දැනුම නිර්මාණය යනාදිය ලඟාකරගෙන ඇත. | හැකි සෑම අවස්ථාවකදී ම පර්යේෂණ නිමැවුම් පිළිබඳ සමාජය දැනුවත් කිරීමටත් තවදුරටත් එම නිමැවුම් සංවර්ධනය කිරීමටත් පර්යේෂකයන් යොමු කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. |
| (ආ) | තාක්ෂණ පැවරුම් ලබාදීමේ මූලික අරමුණ වන්නේ නූතන තාක්ෂණයක් මූලික කොටගත් නව ව්‍යාපාර බිහිකිරීම සඳහා මූල්‍යාධාර සැපයීම වුවත් 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ලබාදෙන ලද තාක්ෂණික ආධාර වලින් කාර්යය නිම කරන ලද රු.82,700,248 ක් වටිනා ප්‍රදානයන් 40 ක් අතුරින් රු.40,643,471 ක් වටිනා ව්‍යාපෘති 20 ක් වාණිජකරණය වී නොතිබුණි. | තාක්ෂණ ප්‍රදාන ලබාදීමේ මූලික අරමුණු දෙකක් වේ. එනම් තාක්ෂණ සංවර්ධනය හා නව තාක්ෂණය මත පදනම්ව නව ව්‍යාපාර බිහිකිරීම වේ.<br>වාණිජ්‍යකරණය නොවූ පර්යේෂණ 18 මඟින් තාක්ෂණික දියුණුව සඳහා මගපෙන්වීම ලබා දී ඇත. ඇතැම් ව්‍යාපෘති වාණිජ්‍යකරණය නොවීමට හේතුලෙස එම ව්‍යාපෘතිවල මූලික අරමුණු මූලාකෘති වර්ධනය හා ප්‍රදාන කාලය තුළ භාණ්ඩ/ ක්‍රියාවලි සංවර්ධනය වීමත් යන දැ වීමය. | හැකි සෑම අවස්ථාවකදී පර්යේෂණ නිමැවුම් පිළිබඳ සමාජය දැනුවත් කිරීමටත් තවදුරටත් එම නිමැවුම් සංවර්ධනය කිරීමටත් පර්යේෂකයන් යොමු කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කෙසේ වෙතත් ජාතික විද්‍යා පදනම ප්‍රදානලාභීන්ට පර්යේෂණ නිමැවුම් තවදුරටත් සංවර්ධනය කිරීමට සහ ව්‍යාපෘති නිමැවුම් වාණිජ්‍යකරණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලෙස නිරන්තරයෙන් උපදෙස් ලබා දී ඇත. | |
| (ඈ) | 2013 ඔක්තෝබර් 01 දින ආරම්භ කරන ලද TG/2013/TECH/D/03 තාක්ෂණික ප්‍රදාන ව්‍යාපෘතිය සඳහා විද්‍යා පදනමේ දායකත්වය රු.3,642,990 ක් වන අතර මෙම ව්‍යාපෘතිය නිම කල යුතු දිනය 2016 ජූනි 30 විය. අවස්ථා 3 කදී මාස 18 ක් දක්වා දින දීර්ඝ කිරීම් සිදු කිරීමට පාලක මණ්ඩල අනුමැතිය ලැබී තිබුණ අතර අවසාන නිම කළ යුතු දිනය 2018 ඔක්තෝබර් 02 දින විය. රෝගීන් සඳහා ස්නායු නැවත පන ගැන්වීමේ අතක් සකස් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වූ අතර එම සකස් කළ අත අදාල රෝගීන්ගේ අවශ්‍යතාවයන් සඳහා සුදුසු දැයි පරික්ෂා කිරීමට 2019 මාර්තු 31 විගණන දිනය වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2013 ඔක්තෝබර් මාසයේ දී ප්‍රදාන ලබා දී තිබුණ ද, පළමු වාරිකය ලබාදීමට හැකිව තිබුණේ 2014 අප්‍රේල් මාසයේදීය. ව්‍යාපෘති නිමැවුමේ වැදගත්කම පිළිබඳ සැලකීමෙන් අනතුරුව - 2017 අප්‍රේල් සිට 2019 අප්‍රේල් කාල දීර්ඝයක් ලබා දී ඇත.<br>ඒ අනුව ප්‍රථම ඒකකය (rehabilitation Arm) පරීක්ෂාව සඳහා සූදානම් කර ඇත. | පර්යේෂණයේ ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් සිදුකිරීමට පර්යේෂකයන් දිරිගැන්විය යුතු අතර පර්යේෂණයේ ප්‍රතිලාභ සමාජගත කිරීමට හැකි ක්‍රමවේදයන් සකස් කළ යුතුය. |
| (ඇ) | පර්යේෂණයක් නිම කර මාස 03 ක් ඇතුළත අවසාන වාර්තාව ලබාදිය යුතු වුවත් 2012 මැයි 09 දින පර්යේෂණ කටයුතු ආරම්භ කර 2016 අප්‍රේල් 27 දින කාර්යය නිම කර තිබූ ප්‍රධාන වටිනාකම රු.1,914,250 ක් වූ RG/2011/AG/06 පර්යේෂණයේ අවසාන ව්‍යාපෘති වාර්තාව ලබා දී තිබුණේ වසරක කාලයක් ප්‍රමාද වී එනම් 2017 මාර්තු 24 දින දීය. | ජාතික විද්‍යා පදනම අවස්ථා කිහිපයකදීම අවසාන වාර්තාව ලබාදෙන ලෙස සිහිකැඳවීම් කර තිබුණද අවසාන වාර්තාව ලබාගැනීමට ප්‍රමාදවීම් සිදුව ඇත. වර්තමානයේදී පර්යේෂණ අංශය මඟින් අවසන් වාර්තා නියමිත දිනට ලබාගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. | අවසන් වාර්තා නියමිත දිනට ලබා ගැනීමට හැකි ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. |
| (ඉ) | 2017 වර්ෂයේ ජූලි මාසයේ දී අනුමත කරන ලද රු.5,353,815 ක් වටිනා උපකරණ ප්‍රදාන 6 කට අදාල මුදල් ලබා දීම සිදුවී තිබුනේ 2018 පෙබරවාරි හා ඔක්තෝබර් මාස වලදී වූ අතර ප්‍රමාදය මාස 7 ත්- 15 ත් අතර විය. | 2017 වර්ෂයේ දී ප්‍රදාන ලබාදී තිබුණත්, අදාල ප්‍රාග්ධන ලැබීම් ආයතනයට ප්‍රමාණවත් පරිදි නොලැබීම හේතුවෙන් ප්‍රමුඛතා අනුපිළිවෙලකට මුදල් ලබාදීම සිදුකර ඇත. ඉදිරියේදී මෙවැනි ප්‍රමාදවීම් වැළැක්වීම සඳහා අග්‍රිම අපේක්ෂාවෙන් පර්යේෂණ උපකරණ ආධාර ලබාදීම සිදු නොකිරීමට තීරණය කර ඇත. | ප්‍රදානය අනුමත කළ වහාම මුදල් ලබාදීමට ද කටයුතු කල යුතුය. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වසර 05 කට වැඩි කාලයක සිට භාණ්ඩාගාර තැන්පතු ලෙස මූල්‍ය ප්‍රකාශන වල අනෙකුත් ජංගම වත්කම් යටතේ දක්වන රු.3,298,965 ක මුදල ප්‍රයෝජනවත් කාර්යයක යෙදවීමට කටයුතු කර නොතිබුණි. | භාණ්ඩාගාර තැන්පතුව රජයේ ආදායමට ගත් බව දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත. | භාණ්ඩාගාරයේ මුදල් ලබා ගනු ලබන්නේ නිශ්චිත සැලසුම් කළ කාර්යයන් සඳහා බැවින් එම කාර්යයන් කඩිනමින් ඉටු කිරීමට කටයුතු කර අරමුදල් උපයෝජනය කාර්යක්ෂම කළ යුතුය. |

### 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පදනමෙහි අරමුණුවලට අදාලව ඉටු කළ යුතු ප්‍රධාන කාර්යයන් 6ක් යටතේ සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඒ සඳහා රු .මිලියන 260ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි .එහෙත් එම ප්‍රධාන ක්‍රියාකාරකම්වලට අදාලව හඳුනාගෙන තිබූ උප ක්‍රියාකාරකම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයන් වෙන් වෙන් වශයෙන් දක්වා නොතිබූ බැවින් එම උප ක්‍රියාකාරකම්වල මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් ඇගයීමට ලක් කළ නොහැකි විය. | ප්‍රධාන ක්‍රියාකාරකම් ඉටුකිරීමට මඟපෙන්වීමක් ලෙස උප ක්‍රියාකාරකම් හඳුනාගෙන ඇත. එමනිසා අයවැය හඳුනාගෙන ඇත්තේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා පමණි. | විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. |
| (ආ) | උප ක්‍රියාකාරකම් 21 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී සපුරා ගැනීමට අපේක්ෂිත ඉලක්ක ප්‍රමාණය කොපමණද යන්න කාර්ය සාධන දර්ශක තුළ දක්වා නොතිබුණු බැවින් ආයතනයේ අපේක්ෂිත ඉලක්කයන්ට ළඟා වූයේද යන්න සැසඳීමට නොහැකි විය. | අපේක්ෂිත අරමුණු ලබා ගැනීමට හැකි අවස්ථාවලදී පමණක් ප්‍රමාණාත්මක KPI හඳුනාගෙන ඇත. ඇතැම් අවස්ථාවලදී පමණක් ගුණාත්මක KPI හඳුනාගත හැකිය. ප්‍රගති සමාලෝචනයන් අතරතුර සුදුසු ඇගයීම්ක්‍රම මඟින් අපේක්ෂිත අරමුණු ළඟාකරගෙන ඇති බවට සහතික කිරීම් කර තිබේ. | ප්‍රමාණාත්මක හා ගුණාත්මක කාර්ය සාධන දර්ශක ක්‍රියාකරී සැලැස්ම මඟින් ඉදිරිපත් කළ යුතුය. |